Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- නාට්‍ය හා රංග කලාව

සතිය - 7

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# විකෘති නාට්‍ය

සෝමලතා සුබසිංහ මහත්මිය

## නාට්‍යයේ තේමාව

වැඩිහිටියන්ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා බාල පරපුර සතු සිතුම් පැතුම් හා අපේක්ෂාවන් බිලිදෙන ආකාරය පෙන්නුම් කිරීම.

# නාට්‍ය දෘෂ්ටිය

- විවෘත ආර්ථිකය හේතු කොටගෙන 80 දශකයෙන් පසුව ලංකාවේ සමාජයත් , පවුලත් අතර සිදුවන්නා වූ ඝට්ටනය ප්‍රේක්ෂක අවධානයට පාත්‍ර කිරීම සහ නූතන ලාංකික වැඩිහිටි පරපුරේ අපේක්ෂාවන් සහ බලාපොරොත්තු බවට පත්වී ඇත්තේ අසීමිත භෞතික සම්පත් වලින් පිරුණු විවිධ තාන්ත මාන්නවලින් යුත් ජිවිත තම දරුවන්ට ලබාදීම, බව නාට්‍යකරුවාගේ මූලික දෘෂ්ටියයි.

- මධ්‍යම පාන්තික පිරිස් තම අරමුණු ඉටු කරගැනීමේ දී විවිධ මිත්‍යාවන්ට පවා පෙළඹෙන අයුරු පෙන්වා දීම සිදු කර ඇත.

- දැඩි ලෙස වාණිජකරණය වූ සමාජයක යහපත් පුරුෂාර්ථයන් විනාශ වී යන බව පෙන්වාදීම නාට්‍යකරුවාගේ දෘෂ්ටිය වේ.

# විකෘති නාට්‍යයේ චරිත නිරූපණය

- ප්‍රියංගනීගේ චරිතය සහ හිල්ඩාගේ චරිතය ප්‍රධාන වශයෙන් වඩාත් ප්‍රබලව නිරූපණය වී තිබීම.
- පියා වන කරුණාරත්නගේ චරිතය තුලින් ප්‍රශ්න, ගැටලු දෙස මැදිහත් සිතින් බලන ආකාරය නිරූපණය වීම.
- ට්‍රික්ෂි , සුසිලා , සම්පත් වැනි චරිත සමඟ බැඳුණු ක්‍රියාකාරීත්වය තුලින් ප්‍රධාන චරිත වන හිල්ඩාගේ සහ ප්‍රියංගනීගේ චරිතය වඩාත් කැපී පෙනීම.

## විකෘති නාට්‍යයේ අවස්ථා නිරූපණය

අවස්ථා නිරූපණයන් රැසක් නට්‍ය තුල ඇති අතර ඒවා තුලින් අධ්‍යාපනික පීඩනය , යෞවනත්වය වටහා නොගැනීම , බලහත්කාරය යනාදිය විද්‍යාමාන කරයි. ඒවා නම්,

- ජගත්, සරණපාල අතීත ආවර්ජන අවස්ථාව
- හිල්ඩාගේ කන්තෝරුවේ නිරූපණ අවස්ථාව
- ප්‍රියංගනීව දැඩි ලෙස ටියුෂන් ලබා දීම සඳහා යොමු කරන අවස්ථාව
- අවසානයේ විවාහය සඳහා ස්වදේශ හා විදේශ පැමිණෙන අවස්ථාව

## විකෘති නාට්‍යයේ රංග ශෛලිය ගොඩනැගී ඇති ආකාරය

- අවස්ථා නිරූපණයන් රැසක් යොදා ගැනීම.
- අවස්ථා නිරූපනණයන්හි චරිත හා ක්‍රියා නිරූපණය බොහෝ සෙයින් ලෝක ධර්මී ස්වභාවයක් ගැනීම.

  (ඇතැම් අවස්ථා වල නාට්‍යධර්මී ලක්ෂණද දක්නට ලැබේ.)

- නාට්‍ය ආරම්භයේ සහ ඇතැම් දර්ශනවලදී විවිධ ගීත සහ නර්තනමය කොටස් යොදා ගැනීම.
- බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට්ගේ රංග ශෛලියෙහි යම් යම් අංග ලක්ෂණ වල ආභාසය ලබමින් නාට්‍ය රංගනය ගොඩනඟා තිබීම.

  උදා :- වේදිකාවේ පසුතල භාවිතය අවම වීම.

  සංකේත (පසුතල )යොදා ගැනීම.

  කෙටි දර්ශන ක්ෂණිකව වෙනස් වීම.

  අදහස් ප්‍රකාශනය සඳහා ගීත හා නර්තනය යොදා ගැනීම.

- ආනුශාංගික අංග භාවිතා කිරීමේදී සංගීතය, නර්තනය,පසුතල මෙන්ම රංගාලෝකය තුලින්ද අවස්ථා තීව්‍ර කර දැක් වීම.

R.M.S.K Ramanayaka

## විකෘති නාට්‍ය තුලින් මතුවන සමාජ පිළිබිඹුව

මෙම නාට්‍ය සෝමලතා සුබසිංහ මහත්මිය යෞවන ප්‍රශ්න අළලා නිර්මාණය කළ නාට්‍යයකි. සමාජයීය හා ආර්ථික වෙනස සමඟ අධ්‍යාපනික රාමුව දැඩි විපර්යාසයන්ට භාජනය වූ සමයක දරුවන්ගේ අපේක්ෂා හා වැඩිහිටියන්ගේ අපේක්ෂා අතර ඇතිවෙන ගැටුම හා අවසානයේ ඔවුනොවුන්ගේ ජීවිත වල ඛේදවාචකය "විකෘති "නාට්‍යයෙන් පැහැදිලි කරයි.

රටේ කුමන සමාජ පංතියකට අයත් වුවද ප්‍රියංගනී, ජගත්,සරණපාල, යන චරිත ත්‍රිත්වය මුහුණ දෙන කණගාටුදායක තත්වය හද කම්පා කරවයි.ප්‍රියංගනී, ජගත් දෙමාපියන්ගේ අනවශ්‍ය බලකිරීම් නිසා මානසික ව්‍යාකූලත්වයට පත්වන චරිත වේ. තමන්ට නොලැබුණ ලෝකය ලබා දීමට උත්සාහ ගත් ග්‍රාමීය අහිංසක දෙමාපිය-නෑදැයන්ගේ බලපෑමෙන් මානසික අසහනයට පත් චරිතයකි;සරණපාල.

තරුණ පරපුර පදනම් කරගෙන නිර්මාණය වුවත් එය ඉලක්කගතව ඇත්තේ සමස්ත වැඩිහිටි පරපුරත්,තීන්දු තීරණ ගෙන ඒවා ක්‍රියාත්මක කරවන පිරිසත් අරමුණු කරගෙනය.

### ප්‍රබලතා

විකෘති නාට්‍ය නූතන අධ්‍යාපන ක්‍රමය ගැන ලියවුණු විශිෂ්ටතමය ස්වභාවයක් ගත් නිරූපනයක් සේ පැවතීම.

සංගීතය සහ නර්තනය යොදා ගැනීම තුලින් නාට්‍ය රංගනය තුල ඇති ඒකාකාරීත්වය මඟහරවා ගෙන තිබීම.

ඇඳුම්-පැළඳුම් ,අංග රචනය ,සාමාන්‍ය ස්වභාවයක් ගැනීම.

### දුබලතා

කෙටි දර්ශන රැසක් යොදා ගැනීම.

නාට්‍ය සංදර්භය හා නොගැළපෙන අයුරින් ශාස්ත්‍රකරු,ටියුෂන්පොළ වැනි අවස්ථා ඉදිරිපත් කිරිම.

අවුරුදු 7 කට පසුව 10 වන දර්ශනය ඉදිරිපත් වීම. ඒ සඳහා බෝඩ් එකක් භාවිත වීම

## මතකයට බිඳක්......

- නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සෝමලතා සුබසිංහ මහත්මියයි.
- දර්ශන 10කි.
- 20 වන සියවසේ 80 දශකයේ නිර්මාණය වී ඇත.
- ප්‍රියංගනී,හිල්ඩා,කරුණාරත්න,සම්පත්, සුසිලා (නැටුම් ගුරුතුමී) ට්‍රික්ෂි,සරණපාල,ජගත්,පියදාස වැනි චරිත දක්නට ලැබේ.
- කතෘගේ වෙනත් කෘති ....පුංචි අපිට දැන් තේරෙයි.

තොප්පි වෙළෙන්දා

---

### විකෘති නාට්‍යයේ හිල්ඩාගේ චරිතය රඟපෑ නිළියෝ

චාන්දනී සෙනෙවිරත්න
කෞශල්‍යා ප්‍රනාන්දු
කුමුදු වික්‍රමතන්ත්‍රි

### ප්‍රියංගනීගේ චරිතය රඟපෑ නිළියෝ

නිල්මිණී සිගේරා
ශ්‍යාමලිකා ප්‍රනාන්දු
ගීතා අලහකෝන්

### කරුණාරත්නගේ චරිතය රඟපෑ නළුවෝ

සුදත් දේවප්‍රිය
දයා අල්විස්
ප්‍රසන්නජිත් අබේසූරිය

### ඇඳුම් හා වේදිකා සැරසිලි

සරත් සූරසේන

### රංගාලෝකය

මහින්ද ඩයස්